# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2011 අංක 28 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 මැයි මස 25 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2011 මැයි මස 27 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 15.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

# 2011 අංක 28 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2011 මැයි මස 25 වන දින]

එල්. ඩී.— ඕ. 18/2010.

**මැතිවරණයක දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා යම් තැනැත්තකු විසින් යම් අශක්නුතාවකට පත් ඡන්දදායකයකු කැටුව යාමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම පිණිස ද; (262 වන අධිකාරය වූ) පළාත් පාලන මැතිවරණ ආඥාපනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1981 අංක 7 දරන ජනමත විචාරණ පනත, 1981 අංක 15 දරන ජනාධිපතිවරණ පනත සහ 1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනත සංශෝධනය කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2011 අංක 28 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

### (262 වන අධිකාරය වූ) පළාත් පාලන මැතිවරණ ආඥාපනතට කරනු ලබන සංශෝධනය

**2.** (මෙහි මින් මතු මේ කොටසේ "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (262 වන අධිකාරය වූ) පළාත් පාලන මැතිවරණ ආඥාපනතේ 54 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— පළාත් පාලන මැතිවරණ ආඥාපනතේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) (අ) ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ ඡන්දදායකයන්ට මාර්ගෝපදේශ සඳහා දී ඇති විධිවිධානවලට අනුකූලව යම් අශක්නුතාවකට පත් සහ එම අශක්නුතාව හේතුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වළක්වාලනු ලබන යම් ඡන්දදායකයකුට, එම ඡන්දදායකයා විසින් නියම කරනු ලබන පරිදි ඡන්ද ස්ථානාධිපතිවරයා සහ ඔහුගේ මැතිවරණ කාර්ය මණ්ඩලයේ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී එම ඡන්ද පත්‍රිකාව ලකුණු කිරීම සඳහා යම් තැනැත්තකු කැටුව යා හැකි අතර එම ඡන්ද පත්‍රිකාව ඡන්ද පෙට්ටිය තුළට බහාලීමට සැලැස්විය හැකි ය.

2—PL 005495—3,340 (2011/02)

(ආ) ඡන්දය දීමට තැනැත්තකු කැටුව යාමට අදහස් කරන යම් අශක්නුතාවකට පත් යම් තැනැත්තකු විසින් මේ පනතේ දසවන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව වූ ආකෘතියක් අනුව සුදුසුකම් ලැබීමේ සහතිකයක් ඡන්ද ස්ථානාධිපතිවරයාට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ වෙනත් සාමාජිකයකුට ඉදිරිපත් කරන්නේ නම් එම අශක්නුතාවට පත් තැනැත්තා ඡන්දය දීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(ඇ) මේ වගන්තියේ කාර්ය සඳහා "කැටුව යන තැනැත්තා" යන්නෙන්, වයස අවුරුදු දහ අටට වඩා අඩු නොවූ ද—

(i) අදාළ මැතිවරණයේ දී තරග කරන අපේක්ෂකයකු නොවන්නා වූ ද;

(ii) අදාළ මැතිවරණයේ දී ඡන්ද ස්ථානාධිපතිවරයකු, බලයලත් නිලධරයකු හෝ ඡන්ද ස්ථාන නියෝජිතයකු නොවන තැනැත්තකු වන්නා වූ ද ;

(iii) යම් අශක්නුතාවකට පත් වූ තැනැත්තකු නොවන්නා වූ ද,

යම් තැනැත්තකු විය යුතු ය.

මේ වගන්තියේ (ආ) ඡේදය ප්‍රකාරව ඡන්දය දීමට සුදුසුකම් ලබන යම් අශක්නුතාවකට පත් ලියාපදිංචි ඡන්දදායකයකු සම්බන්ධයෙන් "අශක්නුතාව" යන්නෙන් —

(i) පූර්ණ හෝ අර්ධ දෘෂ්‍යාබාධිත තත්ත්වයක්; හෝ

(ii) ශාරීරික අශක්නුතාවක්,

හේතුවෙන් වලංගු ලෙස තම ඡන්ද පත්‍රිකාව ලකුණු කිරීම වළක්වන යම් අශක්නුතාවක් අදහස් වේ." .

ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(4අ) යම් අශක්නුතාවකට පත් ඡන්දදායකයකු සමග ඒ ඡන්දදායකයාගේ ඡන්ද පත්‍රිකාව ඡන්දදායකයා විසින් නියම කරන පරිදි ලකුණු කර ඡන්ද පෙට්ටිය තුළට බහාලීමට ඡන්ද මධ්‍යස්ථානය කරා කැටුව යන සෑම තැනැත්තකු ම ඒ ඡන්දය ප්‍රකාශ කිරීමේ රහස්‍යභාවය පවත්වාගෙන යාම සහ පවත්වාගෙන යාමට සහාය දීම කළ යුතු ය.

(4ආ) යම් අශක්නුතාවකට පත් ඡන්දදායකයකු සමග ඒ ඡන්දදායකයාගේ ඡන්ද පත්‍රිකාව ලකුණු කිරීමට ඡන්ද මධ්‍යස්ථානය කරා ඒ තැනැත්තා කැටුව යන සෑම තැනැත්තකුගේ ම අදාළ විස්තර සහිත වාර්තාවක් පවත්වාගෙන යාම ඡන්ද ස්ථානාධිපතිවරයාගේ කාර්යය විය යුතු ය.".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ නමවන උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපලේඛනය එකතු කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියට දසවන උපලේඛනය එකතු කිරීම.

"දසවන උපලේඛනය

(262 වන අධිකාරය වූ - 54(2) (ඇ) වගන්තිය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත ප්‍රකාරව යම් අශක්නුතාවකට පත් තැනැත්තකුට නිකුත් කරන ලද ඡන්දය ප්‍රකාශ කිරීමේ යෝග්‍යතා සහතිකය

I වන කොටස

ඉල්ලුම්කරුගේ/ඡන්දදායකයාගේ ප්‍රකාශය

සම්පූර්ණ නම :.................................................................

ලිපිනය:.......................................................................

රක්ෂාව:.......................................................................

උපන් දිනය:..................................................................

හැඳුනුම්පතේ/රියදුරු බලපත්‍රයේ/විදේශ ගමන් බලපත්‍රයේ අංකය:...........

.........................................................................පදිංචි අශක්නුතාවකට පත් ..........................වන මම ................................ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි ඡන්දදායකයකු වන බව ද, ඉහත තොරතුරු සත්‍ය සහ

නිවැරදි බව ද ප්‍රකාශ කරන අතර, එළඹෙන ................................ සඳහා (මැතිවරණයේ නම) නීතියෙන් විධිවිධාන සලසා ඇති පරිදි අශක්නුතාවකට පත් වූ තැනැත්තකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට මා හට හිමිකම ලබා දීමේ සුදුසුකම් සහතිකයක් නිකුත් කරන මෙන් මෙයින් ඉල්ලුම් කර සිටිමි.

දිනය:................ ඡන්දදායකයාගේ නම:........................

ඡන්දදායකයාගේ අත්සන:.....................

ග්‍රාම නිලධරයාගේ සහතිකය

............................................ගේ (ඉල්ලුම්කරුගේ/ඡන්දදායකයාගේ නම) ඉල්ලුම්පත්‍රයට අදාළ ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, පහත දැක්වෙන තොරතුරු මා විසින් පවත්වාගෙන යන වාර්තාවලට අනුකූලව නිවැරදි බවත් සහතික කරමි.

නම:...........................................................................

ඡන්දහිමි ලැයිස්තුවේ අංකය:..................................................

පළාත :.........................................................................

දිස්ත්‍රික්කය:...........................

ඡන්ද කොට්ඨාසය:......................................

වෙනත් අදාළ තොරතුරු:...........................

දිනය:........................ ග්‍රාම නිලධරයාගේ අත්සන:..................

ග්‍රාම නිලධරයාගේ නම:.....................

කොට්ඨාසය:...........................

මුද්‍රාව:...........................

II වන කොටස

රජයේ වෛද්‍ය නිලධරයාගේ සහතිකය

එළඹෙන ...................... මැතිවරණය සඳහා (මැතිවරණයේ නම) අශක්නුතාවකට පත් තැනැත්තකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති ...............................................යන අය, මා විසින් පෞද්ගලිකව ම පරීක්ෂා

කර ඇති බවත්, නීතියෙන් විධිවිධාන සලසා ඇති පරිදි අශක්නුතාවකට පත් තැනැත්තකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට ඒ.............................................................යන අය (ඡන්දදායකයාගේ / ඉල්ලුම්කරුගේ නම) හිමිකම් ලබන / නොලබන බවත් මෙයින් සහතික කරමි.

දිනය:............................................ රජයේ වෛද්‍ය නිලධරයාගේ නම:....................................

රජයේ වෛද්‍ය නිලධරයාගේ අත්සන:..............................

මුද්‍රාව:............................................... .”.

## II වන කොටස

### 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතට කරනු ලබන සංශෝධනය

**5.** (මෙහි මින් මතු මේ කොටසේ “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 40 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1981 අංක 1 දරන පනතේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

“(2) (අ) ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයේ ඡන්දදායකයන්ට මාර්ගෝපදේශ සඳහා දී ඇති විධිවිධානවලට අනුකූලව යම් අශක්නුතාවකට පත් සහ එම අශක්නුතාව හේතුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වළක්වාලනු ලබන යම් ඡන්දදායකයකුට, එම ඡන්දදායකයා විසින් නියම කරනු ලබන පරිදි ඡන්ද ස්ථානාධිපතිවරයා සහ ඔහුගේ මැතිවරණ කාර්ය මණ්ඩලයේ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී එම ඡන්ද පත්‍රිකාව ලකුණු කිරීම සඳහා යම් තැනැත්තකු කැටුව යා හැකි අතර එම ඡන්ද පත්‍රිකාව ඡන්ද පෙට්ටිය තුළට බහාලීමට සැලැස්විය හැකි ය.

(ආ) ඡන්දය දීමට තැනැත්තකු කැටුව යාමට අදහස් කරන යම් අශක්නුතාවකට පත් යම් තැනැත්තකු විසින් මේ පනතේ පස්වන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව වූ ආකෘතියක් අනුව සුදුසුකම්

ලැබීමේ සහතිකයක් ඡන්ද ස්ථානාධිපතිවරයාට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ වෙනත් සාමාජිකයකුට ඉදිරිපත් කරන්නේ නම් එම අශක්නුතාවකට පත් වූ තැනැත්තා ඡන්දය දීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(ඇ) මේ වගන්තියේ කාර්ය සඳහා "කැටුව යන තැනැත්තා" යන්නෙන්, වයස අවුරුදු දහ අටට වඩා අඩු නොවූ ද—

(i) අදාළ මැතිවරණයේ දී තරග කරන අපේක්ෂකයකු නොවන්නා වූ ද;

(ii) අදාළ මැතිවරණයේ දී ඡන්ද ස්ථානාධිපතිවරයකු, බලයලත් නිලධරයකු හෝ ඡන්ද ස්ථාන නියෝජිතයකු නොවන තැනැත්තකු වන්නා වූ ද ;

(iii) යම් අශක්නුතාවකට පත් වූ තැනැත්තකු නොවන්නා වූ ද,

යම් තැනැත්තකු විය යුතු ය.

මේ වගන්තියේ (ආ) ඡේදය ප්‍රකාරව ඡන්දය දීමට සුදුසුකම් ලබන යම් අශක්නුතාවකට පත් වූ ලියාපදිංචි ඡන්දදායකයකු සම්බන්ධයෙන් "අශක්නුතාව" යන්නෙන් —

(i) පූර්ණ හෝ අර්ධ දෘෂ්‍යාබාධිත තත්ත්වයක්; හෝ

(ii) ශාරීරික අශක්නුතාවක්,

හේතුවෙන් වලංගු ලෙස තම ඡන්ද පත්‍රිකාව ලකුණු කිරීම වළක්වන යම් අශක්නුතාවක් අදහස් වේ .".

ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(4අ) අශක්නුතාවකට පත් යම් ඡන්දදායකයකු සමග ඒ ඡන්දදායකයාගේ ඡන්ද පත්‍රිකාව ඡන්දදායකයා විසින් නියම කරන පරිදි ලකුණු කර ඡන්ද පෙට්ටිය තුළට බහාලීමට ඡන්ද මධ්‍යස්ථානය කරා කැටුව යන සෑම තැනැත්තකු ම ඒ ඡන්දය ප්‍රකාශ කිරීමේ රහස්‍යභාවය පවත්වාගෙන යාම සහ පවත්වාගෙන යාමට සහාය දීම කළ යුතු ය.

(4ආ) යම් අශක්නුතාවකට පත් ඡන්දදායකයකු සමග ඒ ඡන්දදායකයාගේ ඡන්ද පත්‍රිකාව ලකුණු කිරීමට ඡන්ද මධ්‍යස්ථානය කරා ඒ තැනැත්තා කැටුව යන සෑම තැනැත්තකුගේ ම අදාළ විස්තර සහිත වාර්තාවක්

පවත්වාගෙන යාම ඡන්ද ස්ථානාධිපතිවරයාගේ කාර්යය විය යුතු ය.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපලේඛනය එකතු කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියට පස්වන උපලේඛනය එකතු කිරීම.

**"පස්වන උපලේඛනය**

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ (40 (2) (ඇ) වගන්තිය) ප්‍රකාරව යම් අශක්නුතාවකට පත් තැනැත්තකුට නිකුත් කරන ලද ඡන්දය ප්‍රකාශ කිරීමේ යෝග්‍යතා සහතිකය

I වන කොටස

ඉල්ලුම්කරුගේ/ඡන්දදායකයාගේ ප්‍රකාශය

සම්පූර්ණ නම :...................................................................

ලිපිනය:........................................................................

රක්ෂාව:........................................................................

උපන් දිනය:....................................................................

හැඳුනුම්පතේ/රියදුරු බලපත්‍රයේ/විදේශ ගමන් බලපත්‍රයේ අංකය:............

...................................................... පදිංචි අශක්නුතාවකට පත් .................................වන මම...................................... දිස්ත්‍රික්කයේ ලියාපදිංචි ඡන්දදායකයකු වන බව ද, ඉහත තොරතුරු සත්‍ය සහ නිවැරදි බව ද ප්‍රකාශ කරන අතර, එළඹෙන ................................ සඳහා (මැතිවරණයේ නම) නීතියෙන් විධිවිධාන සලසා ඇති පරිදි අශක්නුතාවකට පත් වූ තැනැත්තකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට මා හට හිමිකම ලබා දීමේ සුදුසුකම් සහතිකයක් නිකුත් කරන මෙන් මෙයින් ඉල්ලුම් කර සිටිමි.

දිනය:................... ඡන්දදායකයාගේ නම:........................

ඡන්දදායකයාගේ අත්සන:.....................

ග්‍රාම නිලධරයාගේ සහතිකය

..........................................ගේ (ඉල්ලුම්කරුගේ/ඡන්දදායකයාගේ නම) ඉල්ලුම්පත්‍රයට අදාළ ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, පහත දැක්වෙන තොරතුරු මා විසින් පවත්වාගෙන යන වාර්තාවලට අනුකූලව නිවැරදි බවත් සහතික කරමි.

නම:..........................................................................

ඡන්දහිමි ලැයිස්තුවේ අංකය:.................................................

පළාත :........................................................................

දිස්ත්‍රික්කය:...........................

ඡන්ද කොට්ඨාසය:...........................

වෙනත් අදාළ තොරතුරු:...........................

දිනය:........................ ග්‍රාම නිලධරයාගේ අත්සන:..................

ග්‍රාම නිලධරයාගේ නම:.....................

කොට්ඨාසය:...........................

මුද්‍රාව:...........................

II වන කොටස

රජයේ වෛද්‍ය නිලධරයාගේ සහතිකය

එළඹෙන ...................... මැතිවරණය සඳහා (මැතිවරණයේ නම) අශක්නුතාවකට පත් තැනැත්තකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති .............................................. යන අය මා විසින්, පෞද්ගලිකව ම පරීක්ෂා කර ඇති බවත් නීතියෙන් විධිවිධාන සලසා ඇති පරිදි අශක්නුතාවකට පත් තැනැත්තකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට ඒ ........................................................... යන අය (ඡන්දදායකයාගේ / ඉල්ලුම්කරුගේ නම) හිමිකම් ලබන / නොලබන බවත්, මෙයින් සහතික කරමි.

දිනය :.................................................... රජයේ වෛද්‍ය නිලධරයාගේ නම :...............................

රජයේ වෛද්‍ය නිලධරයාගේ අත්සන :..............................

මුද්‍රාව :....................................”.

## III වන කොටස

### 1981 අංක 7 දරන ජනමත විචාරණ පනතට කරනු ලබන සංශෝධනය

8. (මෙහි මින් මතු මේ කොටසේ "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 7 දරන ජනමත විචාරණ පනතේ 23 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1981 අංක 7 දරන ජනමත විචාරණ පනතේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) (අ) ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ ඡන්දදායකයන්ට මාර්ගෝපදේශ සඳහා දී ඇති විධිවිධානවලට අනුකූලව යම් අශක්නුතාවකට පත් සහ එම අශක්නුතාව හේතුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වළක්වාලනු ලබන යම් ඡන්දදායකයකුට, එම ඡන්දදායකයා විසින් නියම කරනු ලබන පරිදි ඡන්ද ස්ථානාධිපතිවරයා සහ ඔහුගේ මැතිවරණ කාර්ය මණ්ඩලයේ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී එම ඡන්ද පත්‍රිකාව ලකුණු කිරීම සඳහා යම් තැනැත්තකු කැටුව යා හැකි අතර එම ඡන්ද පත්‍රිකාව ඡන්ද පෙට්ටිය තුළට බහාලීමට සැලැස්විය හැකි ය.

(ආ) ඡන්දය දීමට තැනැත්තකු කැටුව යාමට අදහස් කරන යම් අශක්නුතාවකට පත් යම් තැනැත්තකු විසින් මේ පනතේ හතරවන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව වූ ආකෘතියක් අනුව සුදුසුකම් ලැබීමේ සහතිකයක් ඡන්ද ස්ථානාධිපතිවරයාට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ වෙනත් සාමාජිකයකුට ඉදිරිපත් කරන්නේ නම් එම අශක්නුතාවට පත් වූ තැනැත්තා ඡන්දය දීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(ඇ) මේ වගන්තියේ කාර්ය සඳහා "කැටුව යන තැනැත්තා" යන්නෙන්, වයස අවුරුදු දහ අටට වඩා අඩු නොවූ ද—

(i) අදාළ මැතිවරණයේ දී තරග කරන අපේක්ෂකයකු නොවන්නා වූ ද;

(ii) අදාළ මැතිවරණයේ දී ඡන්ද ස්ථානාධිපතිවරයකු, බලයලත් නිලධරයකු හෝ ඡන්ද ස්ථාන නියෝජිතයකු නොවන තැනැත්තකු වන්නා වූ ද ;

(iii) යම් අශක්නුතාවකට පත් වූ තැනැත්තකු නොවන්නා වූ ද,

යම් තැනැත්තකු විය යුතු ය.

මේ වගන්තියේ (ආ) ඡේදය ප්‍රකාරව ඡන්දය දීමට සුදුසුකම් ලබන යම් අශක්නුතාවකට පත් වූ ලියාපදිංචි ඡන්දදායකයකු සම්බන්ධයෙන් "අශක්නුතාව" යන්නෙන් —

(i) පූර්ණ හෝ අර්ධ දෘෂ්‍යාබාධිත තත්ත්වයක්; හෝ

(ii) ශාරීරික අශක්නුතාවක්,

හේතුවෙන් වලංගු ලෙස තම ඡන්ද පත්‍රිකාව ලකුණු කිරීම වළක්වන යම් අශක්නුතාවක් අදහස් වේ. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(4අ) යම් අශක්නුතාවකට පත් ඡන්දදායකයකු සමග ඒ ඡන්දදායකයාගේ ඡන්ද පත්‍රිකාව ඡන්දදායකයා විසින් නියම කරන පරිදි ලකුණු කර ඡන්ද පෙට්ටිය තුළට බහාලීමට ඡන්ද මධ්‍යස්ථානය කරා කැටුව යන සෑම තැනැත්තකු ම ඒ ඡන්දය ප්‍රකාශ කිරීමේ රහස්‍යභාවය පවත්වාගෙන යාම සහ පවත්වාගෙන යාමට සහාය දීම කළ යුතු ය.

(4ආ) යම් අශක්නුතාවකට පත් ඡන්දදායකයකු සමග ඒ ඡන්දදායකයාගේ ඡන්ද පත්‍රිකාව ලකුණු කිරීමට ඡන්ද මධ්‍යස්ථානය කරා ඒ තැනැත්තා කැටුව යන සෑම තැනැත්තකුගේ ම අදාළ විස්තර සහිත වාර්තාවක් පවත්වාගෙන යාම ඡන්ද ස්ථානාධිපතිවරයාගේ කාර්යය විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට හතරවන උපලේඛනය එකතු කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපලේඛනය එකතු කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"හතරවන උපලේඛනය

1981 අංක 7 දරන ජනමත විචාරණ පනතේ (23 (2) (ඇ) වගන්තිය) යම්
අශක්නුතාවකට පත් තැනැත්තකුට නිකුත් කරන ලද
ඡන්දය ප්‍රකාශ කිරීමේ යෝග්‍යතා
සහතිකය

I වන කොටස

ඉල්ලුම්කරුගේ/ඡන්දදායකයාගේ ප්‍රකාශය

සම්පූර්ණ නම :..............................................................

ලිපිනය:....................................................................

රක්ෂාව:....................................................................

උපන් දිනය:...............................................................

හැඳුනුම්පතේ/රියදුරු බලපත්‍රයේ/විදේශ ගමන් බලපත්‍රයේ අංකය:............

.......................................................පදිංචි අශක්නුතාවකට පත් ..................................................................................වන මම ........................................ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි ඡන්දදායකයකු වන බව ද, ඉහත තොරතුරු සත්‍ය සහ නිවැරදි බව ද ප්‍රකාශ කරන අතර, එළඹෙන ................................ සඳහා (මැතිවරණයේ නම) නීතියෙන් විධිවිධාන සලසා ඇති පරිදි අශක්නුතාවකට පත් වූ තැනැත්තකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට මා හට හිමිකම ලබාදීමේ සුදුසුකම් සහතිකයක් නිකුත් කරන මෙන් මෙයින් ඉල්ලුම් කර සිටිමි.

දිනය:.................. ඡන්දදායකයාගේ නම:.......................

ඡන්දදායකයාගේ අත්සන:.....................

ග්‍රාම නිලධරයාගේ සහතිකය

............................................ගේ (ඉල්ලුම්කරුගේ/ඡන්දදායකයාගේ නම) ඉල්ලුම්පත්‍රයට අදාළ ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි බවත් පහත දැක්වෙන තොරතුරු මා විසින් පවත්වාගෙන යන වාර්තාවලට අනුකූලව නිවැරදි බවත් සහතික කරමි.

නම:..........................................................................

ඡන්දහිමි ලැයිස්තුවේ අංකය:..................................................

පළාත :.........................................................................

දිස්ත්‍රික්කය:...........................

ඡන්ද කොට්ඨාසය:...........................

වෙනත් අදාළ තොරතුරු:...........................

දිනය:........................ ග්‍රාම නිලධරයාගේ අත්සන:..................

ග්‍රාම නිලධරයාගේ නම:.....................

කොට්ඨාසය:...........................

මුද්‍රාව:...........................

II වන කොටස

රජයේ වෛද්‍ය නිලධරයාගේ සහතිකය

එළඹෙන ...................... මැතිවරණය සඳහා (මැතිවරණයේ නම) අශක්නුතාවකට පත් තැනැත්තකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ලබාගැනීමට ඉල්ලුම් කර ඇති ..............................................යන අය, මා විසින් පෞද්ගලිකව ම පරීක්ෂා කර ඇති බවත් නීතියෙන් විධිවිධාන සලසා ඇති පරිදි අශක්නුතාවකට පත් තැනැත්තකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට ඒ.............................................................යන අය (ඡන්දදායකයාගේ / ඉල්ලුම්කරුගේ නම) හිමිකම් ලබන / නොලබන බවත් මෙයින් සහතික කරමි.

දිනය:.................................................... රජයේ වෛද්‍ය නිලධරයාගේ නම:..............................................

රජයේ වෛද්‍ය නිලධරයාගේ අත්සන:.........................................

මුද්‍රාව:..................................................".

## IV වන කොටස

### 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනතට කරනු ලබන සංශෝධනය

11. (මෙහි මින් මතු මේ කොටසේ "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනතේ 38 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1981 අංක 15 දරන පනතේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) (අ) ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයේ ඡන්දදායකයන්ට මාර්ගෝපදේශ සඳහා දී ඇති විධිවිධානවලට අනුකූලව යම් අශක්නුතාවකට පත් සහ එම අශක්නුතාව හේතුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වළක්වාලනු ලබන යම් ඡන්දදායකයකුට, එම ඡන්දදායකයා විසින් නියම කරනු ලබන පරිදි ඡන්ද ස්ථානාධිපතිවරයා සහ ඔහුගේ මැතිවරණ කාර්ය මණ්ඩලයේ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී එම ඡන්ද පත්‍රිකාව ලකුණු කිරීම සඳහා යම් තැනැත්තකු කැටුව යා හැකි අතර එම ඡන්ද පත්‍රිකාව ඡන්ද පෙට්ටිය තුළට බහාලීමට සැලැස්විය හැකි ය.

(ආ) ඡන්දය දීමට තැනැත්තකු කැටුව යාමට අදහස් කරන අශක්නුතාවකට පත් වූ යම් තැනැත්තකු විසින් මේ පනතේ පස්වන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව වූ ආකෘතියක් අනුව සුදුසුකම් ලැබීමේ සහතිකයක් ඡන්ද ස්ථානාධිපතිවරයාට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ වෙනත් සාමාජිකයකුට ඉදිරිපත් කරන්නේ නම් එම අශක්නුතාවකට පත් වූ තැනැත්තා ඡන්දය දීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(ඇ) මේ වගන්තියේ කාර්ය සඳහා "කැටුව යන තැනැත්තා" යන්නෙන්, වයස අවුරුදු දහ අටට වඩා අඩු නොවූ ද—

(i) අදාළ මැතිවරණයේ දී තරග කරන අපේක්ෂකයකු නොවන්නා වූ ද;

(ii) අදාළ මැතිවරණයේ දී ඡන්ද ස්ථානාධිපතිවරයකු, බලයලත් නිලධරයකු හෝ ඡන්ද ස්ථාන නියෝජිතයකු නොවන තැනැත්තකු වන්නා වූ ද ;

(iii) යම් අශක්නුතාවකට පත් වූ තැනැත්තකු නොවන්නා වූ ද,

යම් තැනැත්තකු විය යුතු ය.

මේ වගන්තියේ (ආ) ඡේදය ප්‍රකාරව ඡන්දය දීමට සුදුසුකම් ලබන යම් අශක්නුතාවකට පත් වූ ලියාපදිංචි ඡන්දදායකයකු සම්බන්ධයෙන් "අශක්නුතාව" යන්නෙන් —

(i) පූර්ණ හෝ අර්ධ දෘෂ්‍යාබාධිත තත්ත්වයක් ; හෝ

(ii) ශාරීරික අශක්නුතාවක්,

හේතුවෙන් වලංගු ලෙස තම ඡන්ද පත්‍රිකාව ලකුණු කිරීම වළක්වන යම් අශක්නුතාවක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(4අ) යම් අශක්නුතාවකට පත් ඡන්දදායකයකු සමග ඒ ඡන්දදායකයාගේ ඡන්ද පත්‍රිකාව ඡන්දදායකයා විසින් නියම කරන පරිදි ලකුණු කර ඡන්ද පෙට්ටිය තුළට බහාලීමට ඡන්ද මධ්‍යස්ථානය කරා කැටුව යන සෑම තැනැත්තකු ම ඒ ඡන්දය ප්‍රකාශ කිරීමේ රහස්‍යභාවය පවත්වාගෙන යාම සහ පවත්වාගෙන යාමට සහාය දීම කළ යුතු ය.

(4ආ) යම් අශක්නුතාවකට පත් ඡන්දදායකයකු සමග ඒ ඡන්දදායකයාගේ ඡන්ද පත්‍රිකාව ලකුණු කිරීමට ඡන්ද මධ්‍යස්ථානය කරා ඒ තැනැත්තා කැටුව යන සෑම තැනැත්තකුගේ ම අදාළ විස්තර සහිත වාර්තාවක් පවත්වාගෙන යාම ඡන්ද ස්ථානාධිපතිවරයාගේ කාර්යය විය යුතු ය.".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපලේඛනය එකතු කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියට පස්වන උපලේඛනය එකතු කිරීම.

**"පස්වන උපලේඛනය**

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ (38(2)(ඇ) වගන්තිය) ප්‍රකාරව යම් අශක්නුතාවකට පත් තැනැත්තකුට නිකුත් කරන ලද ඡන්දය ප්‍රකාශ කිරීමේ යෝග්‍යතා සහතිකය

**I වන කොටස**

ඉල්ලුම්කරුගේ/ඡන්දදායකයාගේ ප්‍රකාශය

සම්පූර්ණ නම :……………………………………………………………

ලිපිනය:………………………………………………………………

රක්ෂාව:………………………………………………………………

උපන් දිනය:……………………………………………………………

හැඳුනුම්පතේ/රියදුරු බලපත්‍රයේ/විදේශ ගමන් බලපත්‍රයේ අංකය:…………

…………………………………........... පදිංචි අශක්නුතාවකට පත් ……………………………වන මම........................…………………… දිස්ත්‍රික්කයේ ලියාපදිංචි ඡන්දදායකයකු වන බව ද, ඉහත තොරතුරු සත්‍ය සහ නිවැරදි බව ද ප්‍රකාශ කරන අතර, එළඹෙන …………………………… සඳහා (මැතිවරණයේ නම) නීතියෙන් විධිවිධාන සලසා ඇති පරිදි අශක්නුතාවකට පත් වූ තැනැත්තකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට මා හට හිමිකම ලබාදීමේ සුදුසුකම් සහතිකයක් නිකුත් කරන මෙන් මෙයින් ඉල්ලුම් කර සිටිමි.

දිනය:………………  ඡන්දදායකයාගේ නම:…………………….

ඡන්දදායකයාගේ අත්සන:…………………

ග්‍රාම නිලධරයාගේ සහතිකය

………………………………………ගේ (ඉල්ලුම්කරුගේ/ඡන්දදායකයාගේ නම) ඉල්ලුම්පත්‍රයට අදාළ ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි බවත් පහත දැක්වෙන තොරතුරු මා විසින් පවත්වාගෙන යන වාර්තාවලට අනුකූලව නිවැරදි බවත් සහතික කරමි.

නම:……………………………………………………………………….....

ඡන්දහිමි ලැයිස්තුවේ අංකය:……………………………………………..

පළාත :……………………………………………………………………...

දිස්ත්‍රික්කය:………………………

ඡන්ද කොට්ඨාසය:………………………

වෙනත් අදාළ තොරතුරු:………………………

දිනය:…………………… ග්‍රාම නිලධරයාගේ අත්සන:………………

ග්‍රාම නිලධරයාගේ නම:…………………

කොට්ඨාසය:………………………

මුද්‍රාව:………………………

II වන කොටස

රජයේ වෛද්‍ය නිලධරයාගේ සහතිකය

එළඹෙන ...................... මැතිවරණය සඳහා (මැතිවරණයේ නම) අශක්නුතාවකට පත් වූ තැනැත්තකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ලබාගැනීමට ඉල්ලුම් කර ඇති ..............................................යන අය මා විසින් පෞද්ගලිකව ම පරීක්ෂා කර ඇති බවත්, නීතියෙන් විධිවිධාන සලසා ඇති පරිදි අශක්නුතාවකට පත් තැනැත්තකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට ඒ ........................................................... යන අය (ඡන්දදායකයාගේ / ඉල්ලුම්කරුගේ නම) හිමිකම් ලබන / නොලබන බවත් මෙයින් සහතික කරමි.

දිනය:................................ රජයේ වෛද්‍ය
නිලධරයාගේ නම:..........................................

රජයේ වෛද්‍ය
නිලධරයාගේ අත්සන:...................................

මුද්‍රාව:................................................”.

V වන කොටස

1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනතට කරනු ලබන සංශෝධනය

**14.** (මෙහි මින් මතු මේ කොටසේ "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනතේ 38 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

1988 අංක 2 දරන පනතේ 38 වන වගන්තිය සංශෝධන කිරීම.

"(2) (අ) ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයේ ඡන්දදායකයන්ට මාර්ගෝපදේශ සඳහා දී ඇති විධිවිධානවලට අනුකූලව යම් අශක්නුතාවකට පත් සහ එම අශක්නුතාව හේතුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වළක්වාලනු ලබන යම් ඡන්දදායකයකුට, එම ඡන්දදායකයා විසින් නියම කරනු ලබන පරිදි ඡන්ද ස්ථානාධිපතිවරයා සහ ඔහුගේ මැතිවරණ කාර්ය මණ්ඩලයේ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී එම ඡන්ද පත්‍රිකාව ලකුණු කිරීම සඳහා යම් තැනැත්තකු කැටුව යා හැකි අතර එම ඡන්ද පත්‍රිකාව ඡන්ද පෙට්ටිය තුළට බහාලීමට සැලැස්විය හැකි ය.

(ආ) ඡන්දය දීමට තැනැත්තකු කැටුව යාමට අදහස් කරන යම් අශක්නුතාවකට පත් යම් තැනැත්තකු විසින් මේ පනතේ හතරවන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව වූ ආකෘතියක් අනුව සුදුසුකම් ලැබීමේ සහතිකයක් ඡන්ද ස්ථානාධිපතිවරයාට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ වෙනත් සාමාජිකයකුට ඉදිරිපත් කරන්නේ නම් එම අශක්නුතාවකට පත් වූ තැනැත්තා ඡන්දය දීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(ඇ) මේ වගන්තියේ කාර්ය සඳහා "කැටුව යන තැනැත්තා" යන්නෙන්, වයස අවුරුදු දහ අටට වඩා අඩු නොවූ ද—

(i) අදාළ මැතිවරණයේ දී තරග කරන අපේක්ෂකයකු නොවන්නා වූ ද;

(ii) අදාළ මැතිවරණයේ දී ඡන්ද ස්ථානාධිපතිවරයකු, බලයලත් නිලධරයකු හෝ ඡන්ද ස්ථාන නියෝජිතයකු නොවන තැනැත්තකු වන්නා වූ ද ;

(iii) යම් අශක්නුතාවයකට පත් වූ තැනැත්තකු නොවන්නා වූ ද,

යම් තැනැත්තකු විය යුතු ය.

මේ වගන්තියේ (ආ) ඡේදය ප්‍රකාරව ඡන්දය දීමට සුදුසුකම් ලබන යම් අශක්නුතාවකට පත් වූ ලියාපදිංචි ඡන්දදායකයකු සම්බන්ධයෙන් "අශක්නුතාව" යන්නෙන් —

(i) පූර්ණ හෝ අර්ධ දෘෂ්‍යාබාධිත තත්ත්වයක් ; හෝ

(ii) ශාරීරික අශක්නුතාවක්,

හේතුවෙන් වලංගු ලෙස තම ඡන්ද පත්‍රිකාව ලකුණු කිරීම වළක්වන යම් අශක්නුතාවක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(4අ) යම් අශක්නුතාවකට පත් යම් ඡන්දදායකයකු සමග ඒ ඡන්දදායකයාගේ ඡන්ද පත්‍රිකාව ඡන්දදායකයා විසින් නියම කරන පරිදි ලකුණු කර ඡන්ද පෙට්ටිය තුළට බහාලීමට ඡන්ද මධ්‍යස්ථානය කරා කැටුව යන සෑම තැනැත්තකු ම ඒ ඡන්දය ප්‍රකාශ කිරීමේ රහස්‍යභාවය පවත්වාගෙන යාම සහ පවත්වාගෙන යාමට සහාය දීම කළ යුතු ය.

(4ආ) යම් අශක්නුතාවකට පත් ඡන්දදායකයකු සමග ඒ ඡන්දදායකයාගේ ඡන්ද පත්‍රිකාව ලකුණු කිරීමට ඡන්ද මධ්‍යස්ථානය කරා ඒ තැනැත්තා කැටුව යන සෑම තැනැත්තකුගේ ම, අදාළ විස්තර සහිත වාර්තාවක් පවත්වාගෙන යාම ඡන්ද ස්ථානාධිපතිවරයාගේ කාර්යය විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට හතරවන උපලේඛනය එකතු කිරීම,

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපලේඛනය එකතු කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"හතරවන උපලේඛනය

1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනත ප්‍රකාරව යම්
අශක්නුතාවකට පත් තැනැත්තකුට නිකුත් කරන
ලද ඡන්දය ප්‍රකාශ කිරීමේ
යෝග්‍යතා සහතිකය

I වන කොටස

ඉල්ලුම්කරුගේ/ඡන්දදායකයාගේ ප්‍රකාශය

සම්පූර්ණ නම :……………………………………………………….

ලිපිනය:……………………………………………………………

රක්ෂාව:……………………………………………………………

උපන් දිනය:……………………………………………………….

හැඳුනුම්පතේ/රියදුරු බලපත්‍රයේ/විදේශ ගමන් බලපත්‍රයේ අංකය:………… ………………………………….................පදිංචි අශක්නුතාවකට පත් ……………………………වන මම…......………………………… දිස්ත්‍රික්කයේ ලියාපදිංචි ඡන්දදායකයකු වන බව ද, ඉහත තොරතුරු සත්‍ය සහ නිවැරදි බව ද ප්‍රකාශ කරන අතර, එළඹෙන …………………………… සඳහා (මැතිවරණයේ නම) නීතියෙන් විධිවිධාන සලසා ඇති පරිදි අශක්නුතාවකට පත් වූ තැනැත්තකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට මා හට හිමිකම ලබාදීමේ සුදුසුකම් සහතිකයක් නිකුත් කරන මෙන් මෙයින් ඉල්ලුම් කර සිටිමි.

දිනය:……………… ඡන්දදායකයාගේ නම:……………………

ඡන්දදායකයාගේ අත්සන:…………………

ග්‍රාම නිලධරයාගේ සහතිකය

..........................................ගේ (ඉල්ලුම්කරුගේ/ඡන්දදායකයාගේ නම) ඉල්ලුම්පත්‍රයට අදාළ ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි බවත් පහත දැක්වෙන තොරතුරු මා විසින් පවත්වාගෙන යන වාර්තාවලට අනුකූලව නිවැරදි බවත් සහතික කරමි.

නම:..........................................................................

ඡන්දහිමි ලැයිස්තුවේ අංකය:................................................

පළාත :......................................................................

දිස්ත්‍රික්කය:...........................

ඡන්ද කොට්ඨාසය:...........................

වෙනත් අදාළ තොරතුරු:...........................

දිනය:........................ ග්‍රාම නිලධරයාගේ අත්සන:..................

ග්‍රාම නිලධරයාගේ නම:.....................

කොට්ඨාසය:...........................

මුද්‍රාව:...........................

II වන කොටස

රජයේ වෛද්‍ය නිලධරයාගේ සහතිකය

එළඹෙන ...................... මැතිවරණය සඳහා (මැතිවරණයේ නම) අශක්නුතාවකට පත් තැනැත්තකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ලබාගැනීමට ඉල්ලුම් කර ඇති ........................................................................යන අය, මා විසින් පෞද්ගලිකව ම පරීක්ෂා කර ඇති බවත් නීතියෙන් විධිවිධාන සලසා ඇති පරිදි අශක්නුතාවකට පත් තැනැත්තකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට ඒ..............................................................යන අය (ඡන්ද දායකයාගේ/ඉල්ලුම්කරුගේ නම) හිමිකම් ලබන/නොලබන බවත් මෙයින් සහතික කරමි.

දිනය:.............................. රජයේ වෛද්‍ය
නිලධරයාගේ නම:.............................................

රජයේ වෛද්‍ය
නිලධරයාගේ අත්සන:...........................................

මුද්‍රාව:.................................................".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**17.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.